# 01 පරිච්ඡේදය
# සාර්ව ආර්ථිකවිද්‍යාවේ ආරම්භය, විකාශනය හා විෂයපථය

**ධම්මිකා විතානගේ[1] සහ එන්. එම්. ඒ. ජයසිංහ[2]**

[1]dwithanage@sjp.ac.lk; [2]jayasinghe@sjp.ac.lk

**ප්‍රවේශය**

සාර්ව ආර්ථිකවිද්‍යාව තුළින් රටක සමස්ත ක්‍රියාකාරීත්වය පිළිබඳව අවධානය යොමු කරයි. සාර්ව ආර්ථිකවිද්‍යාව වෙනම විෂයය ක් වශයෙන් ආරම්භ වන්නේ 1936න් පසුව වන අතර මේ මගින් විවිධ න්‍යාය හා ප්‍රතිපත්ති විග්‍රහ කරනු ලබයි. මෙම පරිච්ඡේදයේ මුල් කොටසින් බලාපොරොත්තු වන්නේ සාර්ව ආර්ථිකවිද්‍යාවේ විෂයපථය, නූතන සාර්ව ආර්ථිකවිද්‍යාවේ සමාරම්භය සහ සාර්ව ආර්ථිකවිද්‍යාවේ පසුකාලීන සංවර්ධනයට දායක වී තිබෙන අදහස් සාකච්ඡා කිරීමයි. දෙවන කොටසින් සාර්ව ආර්ථිකවිද්‍යාවට අදාළ මූලික ආකෘති පැහැදිලි කරනු ලබයි.

## 1.1 සාර්ව ආර්ථිකවිද්‍යාවේ විෂයපථය

සාර්ව ආර්ථිකවිද්‍යාව, ආර්ථිකවිද්‍යාවේ ප්‍රධාන විෂය ධාරාවක් වන අතර එය පුළුල් ක්ෂේත්‍රයක විහිදී යයි. සාර්ව ආර්ථිකවිද්‍යාවෙන් අවසානයේ බලාපොරොත්තු වන්නේ රටක ආර්ථික ස්ථායිතාව සමඟ ඉහළ ආර්ථික වර්ධනයක් ළඟා කරගනිමින් ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ දමා ගැනීමයි. මේ නිසා සාර්ව ආර්ථිකවිද්‍යාව තුළින් ආර්ථිකයේම හැසිරීම අවධාරණය කරන අතර රජයේ ප්‍රතිපත්තිවල කාර්යභාරය සාකච්ඡා කරයි. සාර්ව ආර්ථිකවිද්‍යා විෂය පථයට ඇතුළත්වන ප්‍රධාන න්‍යාය වන්නේ, ආර්ථික වෘද්ධිය, මුදල් පිළිබඳ න්‍යාය, ජාතික ආදායම, අන්තර්ජාතික වෙළෙඳාම, සේවා නියුක්තිය හා මිල මට්ටමය. මේ හැරුණු විට සාර්ව ආර්ථිකවිද්‍යා විග්‍රහයන්වල දී ප්‍රතිපත්ති කෙරෙහි ඉහළ අවධානයක් යොමු කරන බැවින් රජය සහ අනෙකුත් ආයතනවල ප්‍රතිපත්ති සහ උපායමාර්ග සම්පාදනයේදී අදාළ තීරණ ගැනීමට මග පාදයි. මේ ආකාරයට සාර්ව ආර්ථිකවිද්‍යා න්‍යාය සහ ප්‍රතිපත්ති බිහිවන්නේ ලෝක ආර්ථිකයේ විවිධ වකවානුවල ඇතිවන සුවිශේෂ තත්ත්ව පදනම් කරගෙනය.

## 1.2 සාර්ව ආර්ථිකවිද්‍යාවේ සමාරම්භය

සාර්ව ආර්ථිකවිද්‍යාවට අදාළ සංකල්ප දහනව වැනි ශත වර්ෂය අගභාගයේ සිටම දක්නට ලැබුණත් සාර්ව ආර්ථිකවිද්‍යාව වෙනම විෂයයක් වශයෙන් පිළිගන්නේ 1936 ජේ. එම්. කේන්ස්ගේ (J.M. Keynes) සේවා නියුක්තිය, පොළිය සහ මුදල් පිළිබඳ සාමාන්‍ය න්‍යාය (*The General Theory of Employment, Interest and Money*) නමැති කෘතියෙන් පසුවය. 1936 ට පෙර ලොව ප්‍රචලිතව පැවතියේ සම්භාව්‍ය න්‍යාය (*Classical economics*)යි. සම්භාව්‍ය න්‍යායය ආරම්භ වන්නේ, 1776 ඇඩම්ස් ස්මිත් විසින් ඉදිරිපත් කරන ලද, ජාතීන්ගේ ධනය, එහි ස්වභාවය සහ හේතු පිළිබඳ විමසීමක් නමැති කෘතිය සමඟය. ඒ අනුව සම්භාව්‍යවාදීන් විශ්වාස කරන්නේ පූර්ණ සේවා නියුක්ති සමතුලිතය ආර්ථිකයක සාමාන්‍යයෙන් පවතින තත්ත්වය බවය. එනම් මිල හා වැටුප්වල නම්‍ය ස්වරූපය නිසා යම් විටක ආර්ථික උච්චාවචන (වෙළෙඳ චක්‍ර) හමුවේ ආර්ථික පූර්ණ සේවා නියුක්තියෙන් ඈත්විය හැකි නමුත් එය තාවකාලික සංසිද්ධියක් බව ප්‍රකාශ කරන ලදි. ඒ අනුව සම්භාව්‍යවාදීන් විශ්වාස කරන්නේ පූර්ණ සේවා නියුක්තිය ආර්ථිකයක සාමාන්‍යයෙන් පවතින තත්ත්වය බවත් රජය ආර්ථික කටයුතුවලට මැදිහත් නොවිය යුතු අතර වෙළෙඳපොළ බලවේග අනුව ආර්ථිකය නැවත යථාතත්ත්වයට

පැමිනෙන බවය. සම්භාව්‍ය ආර්ථික විද්‍යාඥයන් ජේ.බී.සේ (J.B. Say) ''සැපයුම මගින් එයට අදාළ ඉල්ලුමක් ජනිත වේ'' (*Supply creates its own demand*) යන අදහස අනුව යමින් ධනවාදී ආර්ථිකයක් තුළ ඉල්ලුම් හා සැපයුම් බලවේග අනුව පූර්ණ සේවා නියුක්තියක් සහිත වෙළෙඳපොළක් ස්වයංක්‍රීයව ඇතිවන නිසා රජය මිල, වැටුප් සහ පොලී අනුපාත වැනි විචල්‍යයන් සඳහා ආර්ථික කටයුතුවලට මැදිහත්වීම අනවශ්‍ය බව පෙන්වා දෙයි.

කෙසේ වුවත් 1929 - 1936 පමණ කාලය තුළ ලොව අනෙකුත් රටවලට සාපේක්ෂව වඩා දියුණු යැයි පිළිගත් ධනවාදී රටවල විශාල වශයෙන් සේවා නියුක්තිය, නිමැවුම් සහ ආදායම පහළ යන්නට විය. ඒ සමඟම භාණ්ඩ හා සේවා සඳහා පැවති ඉල්ලුම පහළ යාම දක්නට ලැබුණි. එනම් ලෝක ව්‍යාප්ත සංසිද්ධියක් වූ ''මහා ආර්ථික අවපාතය'' (*Great depression*) එක්සත් ජනපදය සහ යුරෝපයේ ප්‍රමුඛ ධනේෂ්වර රටවලට බලපෑම් ඇති කළේය. 1933 වන විට අමෙරිකා එක්සත් ජනපදයේ සේවා වියුක්තිය ඉතා ඉහළ අගයක් සටහන් කළේය. පැවති මෙම අවපාත තත්ත්වයට සම්භාව්‍ය න්‍යාය තුළින් විසඳුම් සැපයීමට නොහැකි විය. එම නිසා මෙම මහා ආර්ථික අවපාතය එතෙක් පිළිගෙන තිබූ ආර්ථික චින්තනය වෙනස් මඟකට යොමු කිරීමට සමත් විය.

ඒ අනුව 1936 ජේ.එම්. කේන්ස්ගේ සේවා නියුක්තිය, පොලිය සහ මුදල් පිළිබඳ සාමාන්‍ය න්‍යාය නමැති කෘතිය මගින් මහා ආර්ථික අවපාතය වන විට ලොව පැතිර තිබූ සම්භාව්‍ය මතවාදය අභියෝගයට ලක් කරන ලදි. එයට හේතුව සම්භාව්‍ය ආර්ථික විද්‍යාඥයන් විශ්වාස කළ ආකාරයට, කිසියම් ආර්ථිකයක් පූර්ණ සේවා නියුක්ති මට්ටමින් දුරස් වුවහොත් ස්වයංක්‍රීයව යථා තත්ත්වයට පත්වීම මේ අවස්ථාවේ සිදු නොවීමය. කේන්ස්ට අනුව සමස්ත ඉල්ලුම ආර්ථිකයක් මෙහෙයවන නියමුවා වේ. සමස්ත ඉල්ලුම යනුවෙන් ආර්ථිකයක භාණ්ඩ හා සේවා සඳහා තිබෙන මුලු ඉල්ලුම අදහස් වේ. කේන්ස් පෙන්වා දුන්නේ වෙළෙඳපොළ ආර්ථිකයක් පූර්ණ සේවා නියුක්ති තත්ත්වයෙන් ඈත් වූ විට කෙටිකාලයේ මිල හා වැටුප්වල පවතින අනම්‍යශීලීභාවය නිසා ස්වයංක්‍රීයව යථා තත්ත්වයට පත් නොවන බවයි. ඒ අනුව කේන්ස් පෙන්වා දෙන්නේ සමස්ත ඉල්ලුමේ පහළ යාම නිසා සේවා වියුක්ති තත්ත්වයක් ඇති වන බවයි. ආර්ථිකයේ සමස්ත ඉල්ලුම සමන්විත වන්නේ සංඝටක හතරකිනි. එනම් පරිභෝජන, ආයෝජන, රාජ්‍ය මිලදී ගැනීම් සහ ශුද්ධ අපනයන (රටක් විදේශ රටවල් සමග කරන අපනයන සහ ආනයන අතර වෙනස) මතය. මේ නිසා සමස්ත ඉල්ලුමේ සිදුවන ඕනෑම ඉහළ යාමක් එම සංඝටක හරහා සිදුවිය යුතු බව දක්වයි.

ආර්ථිකයක ඇතිවන සමස්ත ඉල්ලුමේ අඩුවීම ආයෝජන අඩු වීමට බලපායි. එනම් භාණ්ඩ හා සේවා සඳහා පවතින සමස්ත ඉල්ලුම පහළ ගිය විට ව්‍යාපාරිකයන් තමන්ගේ විකිණුම් පහළ යාම අත්දකිනු ලබයි. මෙවැනි අවපාත තත්ත්වයකදී එයින් මිදීම සඳහා රාජ්‍ය වියදම් ඉහළ දැමීම සහ බදු අඩු කිරීම හරහා සමස්ත ඉල්ලුම ඉහළ දැමිය යුතු බව කේන්ස් පෙන්වා දෙන ලදි. එසේම මෙහිදී බදු පහළ දැමීම හරහා පාරිභෝගිකයන්ගේ වැය කළ හැකි ආදායම ඉහළ යන අතර ව්‍යාපාරිකයන් ද ආයෝජනය සඳහා දිරිමත් වේ. මේ අනුව කේන්ස් පෙන්වා දෙන්නේ, අවපාත තත්ත්වය තුළ සමස්ත ඉල්ලුම ඉහළ දමා ගැනීම සඳහා වඩාත් උචිත වන්නේ පිස්කල්. ප්‍රතිපත්ති බවය. එසේම කේන්ස්ට අනුව අතිරික්ත අයවැය ප්‍රතිපත්තියක් පවත්වාගෙන යනවාට වඩා වැදගත් වන්නේ හිඟ අයවැය ප්‍රතිපත්තියක් බව පැහැදිලි වේ. එනම් මිල සහ වැටුප්වල දැඩියාවක් පවතින බැවින් පූර්ණ සේවා නියුක්තිය ඇති කිරීම සඳහා රජය මැදිහත් විය යුතුය යන අදහස පෙන්වා දෙයි. මේ ආකාරයට කේන්ස් විසින් ''දිගු කාලයේ අපි හැමෝම මිය යන බව'' (*''In the long run, we are all dead''*) සඳහන් කරමින් කෙටි කාලීන විසඳුම් ඉදිරිපත් කර ඇත. මහා ආර්ථික අවපාතය තුළ කේන්ස් ඉදිරිපත් කළ මෙම අදහස් ආර්ථික චින්තනයේ හැරවුම් ලක්ෂයක් සනිටුහන් කරයි. ඒ අනුව ඉහත දී සඳහන් කළ ආකාරයටම

සාර්ව ආර්ථිකවිද්‍යාව වෙනම විෂය ධාරාවක් ලෙස ආරම්භ වන්නේ 1936 කේන්ස්ගේ කෘතිය ඉදිරිපත් කිරීමෙන් පසුවය. එය ''කේන්සියානු විප්ලවය'' (*Keynesian revolution*) ලෙස හැඳින්වේ.

### 1.3 සාර්ව ආර්ථිකවිද්‍යාවේ පසුකාලීන සංවර්ධනය

දෙවන ලෝක යුද්ධයෙන් පසුව සාර්ව ආර්ථිකවිද්‍යාවේ විකාශනය සම්බන්ධයෙන් සලකා බලන විට, නව සම්භාව්‍ය සංස්ලේෂණය (*Neo classical Synthesis*) වැදගත් වේ. මෙම අදහස සම්බන්ධයෙන් වැදගත්වන ප්‍රධාන ආර්ථිකවිද්‍යාඥයා වන්නේ පෝල් සැමුවෙල්සන් (Paul Samuelson) ය. නව සම්භාව්‍ය සංස්ලේශණය තුළින් මෙයට පෙර පැවති සම්භාව්‍ය හා කේන්සියානු අදහස් ඒකාබද්ධ කරමින් ඉදිරිපත් කිරීමක් දක්නට ලැබේ. නව සංස්ලේෂණය තුළ සම්භාව්‍යවාදීන් විශ්වාස කළ වෙළෙඳපොළ ක්‍රමය කාර්යක්ෂමය යන්නට එකඟ වේ. ඒ අනුව වෙළඳපොළ ආර්ථිකයක් කෙටි කාලීනව උච්චාවචනවලට මුහුණ දිය හැකි නමුත් දීර්ඝ කාලීනව කාර්යක්ෂම බව පෙන්වා දෙන අතර ආර්ථික කටයුතුවල පහළ යාමක් සිදුවන විට අර්ථිකයට රජය මැදිහත් විය යුතු බව පෙන්වා දෙයි. එනම් කෙටි කාලීනව ආර්ථිකයකට ඇතිවිය හැකි කම්පන වලින් ආරක්ෂා කර සේවා නියුක්තිය ඉහළ දමා ගැනීමටයි. මේ නිසා නව සම්භාව්‍ය සංස්ලේෂණයට අනුව දිගු කාලයේදී සම්භාව්‍යවාදීන්ගේ අදහස් නිවැරදි බවත්, කෙටි කාලීනව ඇතිවන විවිධ කම්පනයක් හමුවේ කේන්ස් පෙන්වා දෙන ආකාරයට සමස්ත ඉල්ලුම ඉහළ දැමීමට රජය මැදිහත් විය යුතු බව පෙන්වා දෙයි.

මේ ආකාරයට නව සම්භාව්‍ය සංස්ලේෂණය තුළ කෙරෙන න්‍යායාත්මක සහ ප්‍රත්‍යක්ෂමූල විග්‍රහයන්වලට පදනම් වන්නේ IS LM ආකෘතිය සහ පිලිප්ස් වක්‍රයයි (*Phillips Curve*). 1970 පමණ වන විට ලොව ප්‍රධාන රටවල් ආර්ථික වර්ධනයක් අත් කරගනිමින් සිටියද නැවතත් ගැටලුකාරී තත්ත්වයකට මුහුණ දීමට සිදුවිය. 1970 මුල්භාගය වනවිටත් පැවති වියට්නාම යුද්ධය නිසා විශේෂයෙන් අමෙරිකා එක්සත් ජනපද ආර්ථිකය එකතැන පල්වන තත්ත්වයක් ඇති වූ අතර උද්ධමනය සහ සේවා වියුක්තිය ඉහළ ගියේය. නව සම්භාව්‍ය සංස්ලේෂණය 1950 ගණන්වල සිට 1970 පමණ තෙක් ලොව ජනප්‍රිය වූ මතවාදයක් වුවත්, අමෙරිකා එක්සත් ජනපදයේ ඇති වූ තත්ත්වයට විසඳුම් ලබා දීමට මෙම න්‍යායට නොහැකි වීම නිසා එම අදහස් ක්‍රමයෙන් යටපත් විය.

මෙම පසුබිම තුළ ආර්ථිකයක මිල මට්ටම් සහ නිමැවුම තීරණය කරන ප්‍රධාන සාධකය මුදල් සැපයුම බව පෙන්වා දෙමින් මූල්‍යවාදී න්‍යාය (*Monetarism*) බිහිවිය. මූල්‍යවාදී ආර්ථික විද්‍යාඥයන් අතර වඩාත් ජනප්‍රියත්වයක් හිමිවන්නේ මිල්ටන් ෆ්‍රීඩ්මන් (Milton Friedman)ට ය. ඒ අනුව සම්භාව්‍ය න්‍යායේ තවත් දිගුවක් ලෙස ආර්ථිකය තුළ මුදල්වල කාර්යභාරය ඉදිරිපත් කළ අතර 1970 දශකය තුළ මෙම න්‍යාය සඳහා වැදගත් ස්ථානයක් හිමිවිය. 1970 මුල් භාගයේ අමෙරිකානු ආර්ථිකය ඇතුලු බොහෝ ආර්ථිකයන් එක තැන පල්වන තත්ත්වය තවදුරටත් තීව්‍රවීමට තෙල් මිල ඉහළ යාමද හේතුවිය. මෙම තත්ත්වය කේන්ස් න්‍යාය තුළින් හෝ නව සම්භාව්‍ය සංස්ලේෂණය තුළින් පැහැදිලි කළ නොහැකි විය. ඒ අනුව කේන්සියානු අදහස්වලට එකතුවක් ලෙස ආර්ථික ස්ථායීතාව සඳහා මූල්‍ය ප්‍රතිපත්ති, ෆිස්කල් ප්‍රතිපත්තිවලට වඩා ශක්තිමත් බව පෙන්වා දෙන ලදි. නිදසුනක් ලෙස ඉහළ පොලී අනුපාතවලදී කුටුම්බයක් වියදම් අඩු කරමින් ඉතිරි කිරීමට පෙලඹෙන අතර පොලී අනුපාතය පහළ දැමූ විට කුටුම්බ වියදම් ඉහළ දමයි. එයින් ආර්ථිකයක කටයුතු ඉහළ යාමට පෙලඹුමක් ලැබේ.

මේ ආකාරයට මූල්‍යවාදීන් මුදල් ප්‍රමාණවාදී න්‍යාය (*Quantity Theory of Money*) පදනම් කරගනිමින් මුදල් සැපයුම පාලනය කිරීමෙන් උද්ධමනය පහත හෙළා ආර්ථිකය ස්ථාවර කිරීම

අවධාරණය කරන ලදි. නමුත් ආර්ථිකයක් ස්ථායකරණය සඳහා මූල්‍ය ප්‍රතිපත්ති යොදා ගැනීමේ සීමාකම් ගැනද ඔවුන් පෙන්වා දෙන ලදි. එනම් කෙටි කාලීනය මුදල් සැපයුම පාලනය කිරීම ඵලදායී වුවත් එය දිගුකාලීනව විසඳුමක් නොවන බව පෙන්වා දෙයි. මේ අනුව මුදල් සැපයුම ඉහළ යාම තුළින් දිගු කාලයේ දී නිමැවුම්, පරිභෝජනය වැනි මූර්ත සාධක කෙරෙහි බලපෑමක් සිදුනොවන අතර මිල මට්ටම් ඉහළ යාමට හේතු වේ. මෙම සංකල්පය ''මුදල්වල දිගු'' කාලීන උදාසීනතාව'' (*Long-Run Monetary Neutrality*) ලෙස හඳුන්වයි. එයට හේතුව මිල මට්ටම් මුදල් සැපයුමට අනුව වෙනස් වන්නේ මන්දගාමීව නිසාය. කෙසේ වුවත් මූල්‍යවාදීන් අදහස් අනුව අමෙරිකා එක්සත් ජනපදයේ ඇති ව තිබූ ඉහළ උද්ධමනකාරී තත්ත්වයට විසඳුම් ලබාදිය නොහැකි වීම නිසා මූල්‍යවාදී න්‍යායට තිබූ විශ්වාසය බිඳ වැටුණි.

ඉහත පසුබිම තුළ විකල්ප න්‍යායක අවශ්‍යතාව මතු විය. එම නිසා 1970 අගභාගය පමණ මූල්‍යවාදීන්ගේ බොහෝ සංකල්ප පිළිගනිමින් නව්‍ය සම්භාව්‍ය න්‍යාය (*New classical economics*) ව්‍යාප්ත විය. නව්‍ය සම්භාව්‍ය ගුරුකුලයේ ප්‍රධාන ආර්ථිකවිද්‍යාඥයා වන්නේ, රොබට් ලූකස් (Robert Lucas)ය. මේ ආකාරයට නැවතත් සම්භාව්‍ය අදහස් පණ ගන්වමින් වෙළඳපොලට රජය මැදිහත් නොවිය යුතු බව ඉදිරිපත් විය. එම අදහස් කොතරම් ප්‍රබල වූයේද යත් බොහෝ පුද්ගලයන් මෙය කේන්සියානු අදහස්වලට එරෙහි ප්‍රති විප්ලවයක් (*Counter Revolution*) ලෙස හැඳින්විය. නව්‍ය සම්භාව්‍යවාදීන්ගේ අදහස් මෙයට පෙර කේන්සියානු සහ මූල්‍යවාදීන්ගේ අදහස්වලට වඩා වෙනස් විය. නව්‍ය සම්භාව්‍යවාදීන් තාර්කික අපේක්ෂණ කල්පිතය (*Rational expectation hypothesis*) ඉදිරිපත් කරන ලදි. එසේම නව්‍ය සම්භාව්‍යවාදීන් සාර්ව ආර්ථිකවිද්‍යාව සම්බන්ධ අදහස් ඉදිරිපත් කිරීමේදී සූක්ෂ්ම ආර්ථිකවිද්‍යා සංකල්ප මත පදනම්ව වෝල්රාසියානු සමතුලිතා (*Walrasion equilibrium*) විග්‍රහය යොදාගෙන ඇත. මේ අනුව කේන්සියානු මතවාදවලට අභියෝග කරමින් මූලික පිලිප්ස්වක්‍ර අදහස පිළිනොගනිමින් මෙම න්‍යාය බිහි විය. ඒ අනුව මිල සහ වැටුප්වල පූර්ණ නම්‍යශීලී බව නිසා භාණ්ඩ හා සේවා මෙන්ම ශ්‍රම වෙළඳ පොළද ස්වාභාවික සේවා වියුක්තිය යටතේ සමතුලිත මට්ටමේ පවතින බව පෙන්වා දෙයි.

එසේම නව්‍ය සම්භාව්‍යවාදීන් පෙන්වා දෙන්නේ, ආර්ථිකයේ සියලුම ඒජන්තවරුන් (කුටුම්බ, ශ්‍රමිකයන් සහ ව්‍යාපාරික ආයතන) තර්කානුකූලව හැසිරෙන බවය. ඒ අනුව ව්‍යාපාරිකයන් තම ලාභය අරමුණු කරගැනීම සඳහාත් කුටුම්බයක් සහ ශ්‍රමික උපයෝගිතාව උපරිම කරගැනීම සඳහා තාර්කිකව හැසිරෙමින් ප්‍රශස්ත තීරණ ගන්නා බව දක්වයි. එසේම ආර්ථික ඒජන්තවරුන් මුදල් මායාවෙන් නොපෙළන බවත් ප්‍රශස්ත තීරණවලදී මූර්ත සංකල්ප සැලකිල්ලට ගන්නා ආකාරයත් පෙන්වා දෙයි. ඒ අනුව ආර්ථික ඒජන්තකරුවන් ''අතීත සහ වර්තමාන තොරතුරු ආදිය පදනම් කරගෙන අනාගතය සම්බන්ධ තාර්කික අපේක්ෂණ ගොඩනගා ගනියි. එලෙස ආර්ථික ඒජන්තවරුන් ආර්ථික ප්‍රතිපත්තියකින් ඇතිවිය හැකි වෙනස්කම් කල්තියා හඳුනාගෙන ඒවා මගහැර කටයුතු කිරීමට පෙලඹේ. මේ ආකාරයට ආර්ථික ඒජන්තයින් පවතින තොරතුරු මත පදනම් වී අනාගතය පිළිබඳ නිවැරදි තීරණ ගන්නා බැවින් ෆිස්කල් හා මූල්‍ය ප්‍රතිපත්ති මඟින් ආර්ථික කටයුතුවලට මැදිහත්වීම ඵලදායී නොවන බව දක්වයි. නිදසුනක් වශයෙන් මූල්‍ය ප්‍රතිපත්තියකින් මිල හා වැටුප්වල නාමික වෙනස්කම් සිදුවුවත් මූර්ථ බලපෑමක් ඇති කළ නොහැකි බව පෙන්වා දෙන අතර අනපේක්ෂිත කම්පන (*unexpected shocks*) තුළින් පමණක් ආර්ථිකයට බලපෑම් ඇති කළ හැකි බව පෙන්වා දේ. නව්‍ය සම්භාව්‍යවාදී මූර්ත ව්‍යාපාර චක්‍ර පිළිබඳව ද අවදාරණය කරන අතර සාර්ව ආර්ථිකයේ අස්ථාවරභාවයට හේතු වන්නේ මූර්ථ ව්‍යාපර චක්‍ර බව පෙන්වා දෙයි. එසේම මූර්ත ව්‍යාපාර චක්‍ර ඇතිවන්නේ මූල්‍ය කම්පනවලින් නොව මූර්ත සාධකවල ඇතිවන වෙනස්කම් අනුව බවත්, එම නිසා ව්‍යාපාර චක්‍රවල නියමුවා වන්නේ ඵලදායීතාවේ ඇතිවන වෙනස්කම් බවද පෙන්වා දෙයි.

නව කේන්ස්වාදීන් (*New Keynesian*) විසින් විසිවන ශතවර්ෂය අග භාගයේ සිට 2008 වර්ෂය වනවිට ඇති වූ ලෝක මූල්‍ය අර්බුධය දක්වා සාර්ව ආර්ථිකවිද්‍යාව තුළ ආධිපත්‍ය දැරීය. නව කේන්ස්වාදීන් 1936 වර්ෂයේ සිට කේන්ස් විසින් ඉදිරිපත් කළ අදහස්වලට අනුගත වෙමින් සම්භාව්‍යවාදීන්ගේ අදහස් ද සැලකිල්ලට ගෙන නව්‍ය සම්භාව්‍යවාදී ආර්ථික විද්‍යාවට ප්‍රතිපක්ෂව නව කේන්ස්වාදීන් තම විග්‍රහයන්වලදී සුක්ෂම ආර්ථිකවිද්‍යා සංකල්ප යොදාගෙන ඇත. එලෙසම කේන්ස්ගේ මූලික අදහස් අනුව යමින් රජය ආර්ථික කටයුතුවලට මැදිහත්වීමේ අවශ්‍යතාවය අවධාරණය කරන ලදී. නව කේන්ස්වාදීන් තාර්කික අපේක්ෂන සංකල්පය පදනම් කරගත්තද කෙටි කාලයේ පූර්ණ තොරතුරු නොලැබී යා හැකි බව දක්වයි. එසේම නව්‍ය කේන්ස්වාදීන් ඉදිරිපත් කළ මූලික පිලිප්ස් වක්‍රයට වඩා වෙනස් වූ පිලිප්ස් වක්‍රය සාර්ව ආර්ථිකවිද්‍යා විෂයපථය තුළ වැඩි වශයෙන්ම යොදා ගැනේ.

නව්‍ය සම්භාව්‍යවාදීන් සාර්ව ආර්ථික න්‍යායන් ගොඩ නගන්නේ වැටුප් හා මිල ගණන් නම්‍යශීලිය යන උපකල්පනය මත සිටය. ඒ අනුව ඔවුන් විශ්වාස කරන්නේ ඉල්ලුම හා සැපයුම ඉක්මනින් හැඩගැසී සමතුලිතය ඇතිවන බවය. නව්‍ය කේන්ස්වාදීන් මෙම තර්කය ප්‍රතික්ෂේප කරමින් මිල සහ වැටුප්වල දැඩියාවක් පවතින බව පෙන්වා දෙයි. මේ ආකාරයට මිල සහ වැටුප්වල පවතින දැඩියාව නිසා ආර්ථික උච්චාවචන වලදී මන්දගාමීව හැඩ ගැසෙන බව දක්වයි. මේ නිසා මිල සහ වැටුප්වල පවකින දැඩියාව සේවා වියුක්තියට හේතුවන බව දක්වයි. නව කේන්ස්වාදීන් තර්ක කරන්නේ රජයේ පිස්කල් හා මූල්‍ය ප්‍රතිපත්ති හරහා වෙළෙඳපොළ අපූර්ණතා ඉවත් කළ හැකි බවය. ඒ අනුව නව කේන්ස්වාදීන් රජය මැදිහත්වීම සාධාරණීකරණය කරයි. කෙටි කාලීනව ඇතිවන ආර්ථික උච්චාවචනවලදී නිමැවුම සහ සේවා නියුක්තිය යථා තත්ත්වයට පත් කර ආර්ථික ස්ථායිකරණය සඳහා ෆිස්කල් හා මූල්‍ය ප්‍රතිපත්තිය මගින් රජය ආර්ථිකයට මැදිහත් විය යුතු ආකාරය පෙන්වා දෙයි. මේ අනුව කාලීන සාර්ව ආර්ථික විග්‍රහයන්වලදී නව කේන්සියානු ආකෘතිය වැදගත් ස්ථානයක් උසුලයි.

## 1.4 සාර්ව ආර්ථිකවිද්‍යාවට අදාළ මූලික ආකෘති


### 1.4.1 නිෂ්පාදනය හා සේවා නියුක්තිය

සම්භාව්‍ය න්‍යාය අනුව ලාභය උපරිම කරන ආයතන විසින් ශ්‍රමය සඳහා ඉල්ලුම ලබා දෙන්නේ නිෂ්පාදන මිල, වැටුප් හා ශ්‍රමයේ ආන්තික නිෂ්පාදන අනුපාතයට $\left({}^{W}\!/_{MPN}\right)$ සමාන කිරීමෙනි. මිල (P) නිමැවුම් ඒකකයක් විකිණීමෙන් ලැබෙන එහි ආන්තික ආදායමට (MR) සමාන වන අතර වැටුප් හා ශ්‍රමයේ ආන්තික නිෂ්පාදන අනුපාතය යනු අතිරේක නිමැවුම් ඒකකයක් නිෂ්පාදනය කිරීමේ ආන්තික පිරිවැය වේ. මේ අනුව ශ්‍රමයේ මූර්ථ වැටුප $\left({}^{W}\!/_{P}\right)$ වන්නේ ශ්‍රමයේ ආන්තික නිෂ්පාදනය (MPN) මිස අන් කිසිවක් නොවේ. මෙය ශ්‍රමය සඳහා සෘණ බෑවුම් ඉල්ලුම් වක්‍රයක් ලබා දෙයි.

$N_D = f(w/P)$……. ශ්‍රමයේ ඉල්ලුම

තනි තනි ශ්‍රමිකයින් විසින් උපරිම කරනු ලබන උපයෝගීතාව මත ශ්‍රම සැපයුම පදනම් වන අතර මූර්ථ වැටුප මත ධනාත්මකව රඳා පවතී.

$N_S = g(w/P)$……. ශ්‍රමයේ සැපයුම





1.1 රූපය: ශ්‍රම ඉල්ලුම හා ශ්‍රම සැපයුම-සම්භාව්‍ය න්‍යාය


වැටුප් හා මිල ගණන්වල පූර්ණ නම්‍යශීලීභාවය පිළිබඳ උපකල්පනය අනුව, ශ්‍රම වෙළෙඳපොළ පූර්ණ සේවා නියුක්ති සමතුලිතතාවයේ පවතී. එනම්, ශ්‍රම සැපයුම ශ්‍රමය සඳහා ඇති ඉල්ලුමට සමාන වේ. සේවා වියුක්තියක් නොමැත. 1.1 රූපයෙහි ඉහළ පුවරුවේ ශ්‍රම සැපයුම සහ ශ්‍රම ඉල්ලුම මූර්ත වැටුපෙහි ශ්‍රිතයන් ලෙස ඉදිරිපත් කර ඇත. පහළ පුවරුවේ, ශ්‍රම සැපයුම සහ ශ්‍රම ඉල්ලුම මුදල් වැටුපේ ශ්‍රිතයන් ලෙස ඉදිරිපත් කර ඇත. මිල මට්ටම $P$ සිට $2P$ දක්වා සහ පසුව $3P$ දක්වා වැඩි වන විට, නාමික වැටුප් පිළිවෙළින් w, 2w සහ 3w දක්වා වැඩි වුවහොත් මූර්ත වැටුප එම මට්ටමේම පවත්වා ගත හැක ($\frac{3w_1}{3P_1} = \frac{2w_1}{2P_1} = \frac{w_1}{P_1}$). වැටුප් අනුපාතය වැඩි නොකළහොත්, ශ්‍රම සැපයුම අඩු වනු ඇත ($N'_2$).

### 1.4.2 සම්භව්‍ය සමස්ත සැපයුම් වක්‍රය

මේ නිසා සම්භාව්‍ය න්‍යාය අනුව සෑම විටම දෙනු ලබන ඕනෑම නිෂ්පාදන ශ්‍රිතයක නිමැවුම පූර්ණ සේවා නියුක්ති නිමැවුමක් බවට පරිවර්තනය වේ (1.2 රූපය). එබැවින් පූර්ණ සේවා නියුක්ති නිමැවුම් මට්ටමේ දී පූර්ණ අනම්‍ය සමස්ත සැපයුම් (AS) වක්‍රයක් සහතික කරනු ලබයි (1.3 රූපය).




1.2 රූපය: ශ්‍රම වෙළෙඳපොළ සමතුලිතතය, නිමැවුම හා සේවා නියුක්තිය




1.3 රූපය: සම්භාව්‍ය සමස්ත සැපයුම් වක්‍රය

### 1.4.3 මුදල් ප්‍රමාණවාදී න්‍යාය සහ මිල මට්ටම

සම්භාව්‍ය න්‍යායවාදීන් විශ්වාස කළේ හුවමාරු මාධ්‍යයක් ලෙස එහි ක්‍රියාකාරිත්වය සඳහා මුදල් ඉල්ලා සිටින බවයි. මේ අනුව ආර්ථිකයේ මුළු මුදල් තොගය (මුදල් සැපයුම් සංසරණ ප්‍රවේගය) ගනුදෙනුවල නාමික අගයට හෝ ආර්ථිකයේ ආදායමේ හෝ නිෂ්පාදනයේ නාමික අගයට සමාන වේ.


$MV \equiv PY$

මුදලේ සංසරණ ප්‍රවේගය පූර්ව නිර්ණය කර ඇත්නම් ($V = \bar{V}$ වේ නම්) සහ ආර්ථිකයේ නිමැවුම් මට්ටම පූර්ණ සේවා නියුක්ති නිමැවුම් මට්ටම වන අතර එය ස්ථාවර නම් ($Y = \bar{Y}$ වේ නම්), මිල මට්ටම (P) මුදල් සැපයුමට (M) සමානුපාතික වේ (මුදල් සැපයුම බහිර්ජන්‍ය වේ).

$P = (\bar{V}/\bar{Y}) \times M$

### 1.4.4 සමස්ත ඉල්ලුම් වක්‍රය හා සමතුලිතය

මෙතැයින් බලන කල සම්භාව්‍යවාදීන්ට අනුව ශ්‍රම වෙළෙඳපොළ සහ නිෂ්පාදන ක්‍රියාකාරිත්වය ආර්ථිකයේ නිමැවුම් මට්ටම තීරණය කරන අතර මුදල් සැපයුම මිල මට්ටම තීරණය කරයි. මුදල් ප්‍රමාණ න්‍යාය මගින් සම්භාව්‍ය සේවා නියුක්තිය සහ ආදායම තීරණය වීමට අදාළ සමස්ත ඉල්ලුම වක්‍රය (AD) ද ලබා ගත හැකි ය. $MV \equiv PY$ සමීකරණයේ Y මූර්ථ ජාතික ආදායම වන විට PY යනු නාමික ජාතික නිෂ්පාදිතය වේ. මේ නිසා MV නාමික ජාතික නිෂ්පාදිතය ලෙස ද සැලකිය හැකිය. ආර්ථිකයක් සමතුලිත වන විට නාමික ජාතික නිෂ්පාදිතය සමස්ත වියදමට (AD) සමාන වේ. එසේ නම් MV වක්‍රය මගින් ආර්ථිකයෙහි සමස්ත ඉල්ලුම් වක්‍රය ලබාගත හැකිය. මෙම MV වක්‍රය හෙවත් සමස්ත ඉල්ලුම් වක්‍රය සමග සම්භාව්‍ය සමස්ත සැපයුම් වක්‍රය සම්බන්ධ කිරීමෙන් ආර්ථිකයේ සමතුලිත නිමැවුම හා මිල මට්ටම ලබා ගත හැකිය (1.4 රූපය).




1.4 රූපය: සමතුලිත නිමැවුම හා මිල සම්භාව්‍ය අදහස

### 1.4.5 භාණ්ඩ වෙළෙඳපොළ සමතුලිතතාව

කේන්සියානු න්‍යාය තුළ, භාණ්ඩ සහ මුදල් වෙළෙඳපොළ එකිනෙකට සම්බන්ධ වේ. භාණ්ඩ වෙළෙඳපොළේ, පරිභෝජනය (සහ ඉතිරි කිරීම) ප්‍රධාන වශයෙන් තීරණය වන්නේ වැය කළ හැකි ආදායම මතය. සම්භාව්‍යවාදීන්ට අනුව ඉතිරිකිරීම (සහ ඒ නිසා පරිභෝජනය) පොලී අනුපාතිකයේ ශ්‍රිතයක් වූ නමුත් කේන්සියානු අදහස ආදායමේ ශ්‍රිතයක් වන බවයි. එය ආදායමේ ධන ශ්‍රිතයක් වේ. මෙම න්‍යායයන්හි පළමු ප්‍රධාන වෙනස මෙය වේ. ඒ අනුව ආන්තික පරිභෝජන නැමියාව (MPC) c ද, වැය කළ හැකි ආදායම $Y_d$ ද, වන විට කේන්සියානු පරිභෝජන ශ්‍රිතය (C) මෙසේ පෙන්විය හැකිය.

$$C = \bar{C} + cY_d$$

ආයෝජනය යනු පොලී අනුපාතිකයේ සෘණ ශ්‍රිතයක් වන නමුත් ආයෝජන ක්‍රියාකාරිත්වය රඳා පවතින්නේ ආයෝජනයේ ලාභදායීතාව මතය. කේන්ස් විශ්වාස කළේ ආයෝජනය සමස්ත ඉල්ලුමේ බෙහෙවින් විචල්‍ය අංගයක් බවයි. ආන්තික ආයෝජන නැමියාව b ද පොලී අනුපාතිකය i ද වන විට ආයෝජන ශ්‍රිතය (I) මෙසේ වේ.

$$I = \bar{I} + bi$$

රජයේ වියදම් (G) බාහිර වශයෙන් ලබා දී ඇති සහ NX මගින් දැක්වෙන ශුද්ධ අපනයන ලෙස ගත් විට, භාණ්ඩ වෙළෙඳපොළේ සමතුලිතතාව පහත සමීකරණ මගින් පෙන්විය හැක:

$Y = C + I + G$ සංවෘත ආර්ථිකයක භාණ්ඩ වෙළෙඳපොළේ සමතුලිතතාව

$Y = C + I + G + NX$ විවෘත ආර්ථිකයක භාණ්ඩ වෙළෙඳපොළේ සමතුලිතතාව

### 1.4.6 මුදල් වෙළෙඳපොළ හා පොලී අනුපාතය

කේන්සියානු න්‍යාය, සම්භාව්‍ය න්‍යායෙන් තවත් ප්‍රධාන බැහැරවීමක් වන්නේ පොලී අනුපාතය තීරණය කිරීම යි. කේන්ස්ට අනුව, මුදල් වෙළෙඳපොළ තුළ පොලී අනුපාතය තීරණය වන්නේ මුදල් සඳහා ඇති ඉල්ලුම සහ මුදල් සැපයුම මගිනි. මුදල් සැපයීම මුදල් අධිකාරීන් (මහ බැංකුව) විසින් ලබා දෙන අතර එය බාහිරව ලබා දී ඇති ලෙස සැලකිය හැකිය. මුදල් සඳහා ඇති ඉල්ලුම (i) ගනුදෙනු, (ii) ආරක්ෂණ සහ (iii) සමපේක්ෂණ යන චේතනා තුනකින් පාලනය වේ. මුදල් ඉල්ලුම පිළිබඳ පෙර න්‍යායන්වල මෙන්, ගනුදෙනු මුදල් ඉල්ලුම සහ ආරක්ෂණ මුදල් ඉල්ලුම ගනුදෙනුවල සැබෑ පරිමාව හෝ සැබෑ ආදායමේ මට්ටම මත ධනාත්මකව රඳා පවතී.

කේන්ස්ගේ දායකත්වය සමපේක්ෂණ චේතනාව පිළිබඳ න්‍යායගත කිරීම තුළ මුදල් ඉල්ලුම අනාගත පොලී අනුපාතය පිළිබඳ අපේක්ෂාවන් මත රඳා පවතී. ඉතා ඉහළ පොලී අනුපාතයක් (සාමාන්‍යයට වඩා වැඩි) ප්‍රතිඵලයක් ලෙස සමපේක්ෂණ අරමුණු සඳහා ඉතා සුළු පිරිසක් මුදල් ඉල්ලුම් කරයි. කෙසේ වෙතත් අඩු පොලී අනුපාතයක් (සාමාන්‍ය මට්ටමට වඩා අඩු) පොලී අනුපාතය ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අනුව, එය මුදල් සඳහා ඉල්ලුම වැඩි කිරීමට හේතු වේ. මෙය පොලී අනුපාතිකයට ප්‍රතිලෝමව සම්බන්ධ වන මුදල් ඉල්ලුම් ශ්‍රිතයක් ලබා දෙයි. ඉතා අඩු පොලී අනුපාත යටතේ ද්‍රවශීලතා පාශය (*liquidity trap*) පැවතිය හැකි බව කේන්ස් කතා කළේය.


මුදල් ඉල්ලුම $L = kY - hi$ ලෙස ප්‍රකාශ කළ හැකි අතර මූර්ත මුදල් ඉල්ලුම මූර්ත මුදල් සැපයුමට $(M/P)$ සමාන වන පොලී අනුපාතයෙහි දී මුදල් වෙළෙඳපොළෙහි සමතුලිතතාව පවතී.

$M/P = kY - hi$


මේ අනුව, කේන්සියානු අදහස් තුළ, භාණ්ඩ හා මුදල් වෙළෙඳපොළ එකිනෙකට සම්බන්ධ වන බැවින් පොලී අනුපාතිකයේ සහ ආදායමේ සමතුලිත අගයන් එකවර තීරණය කළ යුතුය.

### 1.4.7 IS-LM රාමුව

IS-LM ආකෘතිය භාණ්ඩ හා මුදල් වෙළෙඳපොළවල සමකාලීන සමතුලිතතා පෙන්වීමට භාවිත කරන පොදු සාර්ව ආර්ථික මෙවලමකි. මෙම ආකෘතිය කේන්සියානු ඉල්ලුම් වක්‍රය ව්‍යුත්පන්න කිරීමට උපකාරී වේ. IS වක්‍රය පෙන්නුම් කරන්නේ භාණ්ඩ වෙළෙඳපොළ සමතුලිතයේ පවතින පොලී අනුපාතය (i) සහ ආදායම් (Y) වල සංයෝජනයයි (1.6 රූපය). LM වක්‍රය මගින් මුදල් වෙළෙඳපොළ සමතුලිතව පවතින i සහ Y සංයෝගය පෙන්වයි (1.7 රූපය). Y ආදායම ද I පොලී අනුපාතය ද A ආර්ථිකයේ ස්වාධීන වියදම්වල අගය ද වන විට IS වක්‍රයේ සමීකරණය $Y = A - bi$ මගින් දෙනු ලබයි. b යනු පොලී අනුපාතයට ආයෝජන වියදම්වල ප්‍රතිචාර දැක්වීමයි. නැතහොත් ආන්තික ආයෝජන නැමියාව යි. LM වක්‍රය මූර්ථ මුදල් සැපයුම $(M/P)$ මත ලබා දී ඇති අතර ආදායමට මුදල් ඉල්ලුමේ ප්‍රතිචාර දැක්වීම k පරාමිතිය මගින් ද පොලී අනුපාතයට මුදල් ඉල්ලුමේ ප්‍රතිචාර දැක්වීම h පරාමිතිය මගින් ද ලබා දෙන විට LM වක්‍රයේ සමීකරණය $M/P = kY - hi$ මගින් ලබා දෙයි.





1.6 රූපය: IS වක්‍රය





1.7 රූපය: LM වක්‍රය

කේන්සියානු විශ්ලේෂණයේ පවත්නා විශේෂත්වය වන්නේ ආර්ථිකයේ මුදල් ඉල්ලුම ද්‍රවශීලතා පාෂයේ (*liquidity trap*) පවතින තත්ත්වයක් පිළිබඳ පැහැදිලි කිරීමයි. එයින් අදහස් වන්නේ මුදල් ඉල්ලුම පොලී අනුපාතයට පූර්ණ වශයෙන් නම්‍ය වීමයි. එනම් ආර්ථිකයේ මුදල් ඉල්ලුම පොලී අනුපාතයට සංවේදී නොවීමයි. එවන් මුදල් ඉල්ලුම් වක්‍රයක් තිරස් අක්ෂයට සමාන්තර වේ (1.8 රූපය).




1.8 රූපය: ද්‍රවශීලතා උගුල යටතේ LM වක්‍රය





1.9 රූපය: ආර්ථිකයේ පොදු සමතුලිතය

කේන්සියානු විග්‍රහයට අනුව IS හා LM වක්‍ර දෙකෙහි ඡේදනය මගින් ආර්ථිකයේ සමතුලිත පොලී අනුපාතය හා ආදායම් මට්ටම් ලබා දෙයි (1.9 රූපය). ආර්ථිකයේ තීරණය වන සමතුලිත නිමැවුම සම්භාව්‍ය ආකෘතියේ දී සෑම විටම පූර්ණ සේවා නියුක්ති මට්ටමේ පවතින බව පෙන්වා දුන්න ද කේන්සියානු ආකෘතියේ දී, ආර්ථිකයේ සමතුලිතතාව නිමැවුමේ ඕනෑම මට්ටමක විය හැකිය. මේ අනුව විශාල සේවා වියුක්තියකදී වුවද ආර්ථිකයේ සමතුලිතතාවක් ඇති විය හැකි බවට සාර්ව ආර්ථික න්‍යාය ක්‍රමයෙන් විකාශනය වී ඇත. එයින් ගම්‍ය වන්නේ කේන්සියානු න්‍යාය යටතේ පූර්ණ සේවා නියුක්ති ආර්ථික මට්ටම සහතික නොවන බවයි.

### 1.4.8 කේන්සියානු සමස්ත ඉල්ලුම් වක්‍රය

සමාගම් නිමැවුම නිෂ්පාදනය කරන්නේ එය විකිණීමට අපේක්ෂා කරන්නේ නම් පමණි. ආර්ථිකයේ නිෂ්පාදන සාධකවල ප්‍රමාණාත්මක බව මත දළ දේශීය නිෂ්පාදිතය තීරණය කරන අතර, ඇත්ත වශයෙන්ම විකුණනු ලබන භාණ්ඩ හා සේවා ප්‍රමාණය මූර්ත දළ දේශීය නිෂ්පාදිතය වන අතර එය ආර්ථිකය පුරා පවතින ඉල්ලුම මත රඳා පවතී.




1.10 රූපය: කේන්සියානු සමස්ත ඉල්ලුම් වක්‍රය


### 1.4.9 කේන්සියානු සමස්ත සැපයුම් වක්‍රය

සම්භාව්‍ය න්‍යාය මෙන් නොව, කේන්ස් ශ්‍රම වෙළෙඳපොළ පිළිබඳ ගිවිසුම්ගත දෘෂ්ටියක් දැරීය. වැටුප් සාමාන්‍යයෙන් තීරණය වන්නේ සේවා යෝජකයන් (සමාගම්) සහ කම්කරුවන් (ශ්‍රමිකයන්) අතර ගිවිසුමක් මගිනි. මහා ආර්ථික අවපාත වසරෙහි නිරීක්ෂණ මත පදනම්ව, කේන්ස් විශ්වාස කළේ ශ්‍රම වෙළෙඳපොළ වැටුප් ඉක්මනින් සකස් නොවන බවයි. නමුත් සම්භාව්‍ය ආර්ථික විද්‍යාඥයන් මුදල් වැටුප් පූර්ණ නම්‍යශීලී බව විශ්වාස කළ අතර, කේන්සියානු න්‍යාය වැටුප් දැඩි බව (එනම් නම්‍යශීලීභාවයක් නොමැතිකම) පෙන්වා දෙන අතර ඒ සඳහා පැහැදිලි කිරීම් ගණනාවක් ඉදිරිපත් කර ඇත.


වැටුප් අනුපාතය සේවා වියුක්තිය සමඟ ප්‍රතිලෝමව වෙනස් වන අතර එම නිසා සේවා නියුක්තිය හා ආදායම සමඟ අනුලෝමව වෙනස් වේ. සමස්ත සැපයුම් වක්‍රය (AS) මඟින් විවිධ මට්ටමේ නිමැවුම් සපයන මිල ගණන් පෙන්වයි. නිෂ්පාදන ආයතන විසින් අය කරන මිල ඔවුන්ගේ භාණ්ඩ නිෂ්පාදන පිරිවැය මත රඳා පවතී. එම නිසා නිමැවුම් මට්ටම් වැඩි වන විට වැටුප් වැඩි වන අතර සේවා වියුක්තිය අඩු වේ. එහි ප්‍රතිඵලයක් ලෙස නිෂ්පාදන මට්ටම ඉහළ යාමත් සමඟ මිල ඉහළ යයි. මේ අනුව, කේන්සියානු සමස්ත සැපයුම වක්‍රය මිල සහ නිමැවුම අතර ධනාත්මක සම්බන්ධයක් පෙන්නුම් කරයි. එහෙත් සම්භාව්‍යවාදීන් පෙන්වා දෙනු ලැබූයේ සිරස් සමස්ත සැපයුම් වක්‍රයක් වන අතර එය වැටුප් පූර්ණ නම්‍ය බව මත පදනම්

වේ. එමෙන්ම වැටුප් පූර්ණ වශයෙන් දෘඪ යැයි උපකල්පනය කරන්නේ නම්, පූර්ණ නම්‍ය සමස්ත සැපයුම් වක්‍රයක් ලැබේ.

මෙහිදී කේන්සියානු විශ්ලේෂණයේ අවස්ථා දෙකක් දැකගත හැකිය. කෙටි කාලීනව ව්‍යාපාර චක්‍රයේ අවපාත අවධියේදී, ආර්ථිකයේ විරැකියාව ඉහළ මට්ටමක පවතින අතර, එම නිසා කෙටි කාලීනව සමස්ත ඉල්ලුමෙහි වැඩි වීම හේතුවෙන් වැටුප් අනුපාතයේ වැඩි වීමක් සිදු නොවේ. එම නිසා කෙටි කාලීනව සමස්ත සැපයුම් වක්‍රය පූර්ණ නම්‍ය වේ. එය බොහෝ විට 'කේන්සියානු සමස්ත සැපයුම් වක්‍රය' (*Keynesian Aggregate Supply Curve*) ලෙස හැඳින්වේ (1.11 රූපය). ආර්ථික චින්තනයේ පසුකාලීන වර්ධනයන්හිදී මෙම සැපයුම් වක්‍ර 'කෙටිකාලීන සමස්ත සැපයුම් වක්‍රය' (*Short-run Aggregate Supply Curve*) ලෙස හැඳින්වීමට පටන් ගත්තේය. කෙසේ වෙතත්, මධ්‍ය කාලීනව, AS වක්‍රය ඉහළට බෑවුම් වේ (1.12 රූපය).




1.11 රූපය: කේන්සියානු සමස්ත සැපයුම් වක්‍රය




1.12 රූපය: දිගු කාලීන AS වක්‍රය

**1.4.10 පිලිප්ස් වක්‍රය**

මුදල් සැපයුමේ වෙනස්වීම ආර්ථිකයේ මූර්ථ නිමැවුම හා සේවා නියුක්තිය කෙරෙහි බලනොපාන බව පෙන්වා දෙමින් සම්භාව්‍ය ආර්ථික විද්‍යාඥයන් මුදල් සැපයුම් උදාසීන යැයි විශ්වාස කළ අතර කේන්සියානු පැහැදිලි කිරීම් මගින් මුදල් සැපයුම වැඩිවීම නිසා පොලී අනුපාතිකයේ අඩුවීමක් ඇති වී එය ආයෝජන මට්ටම ඉහළ යාමට හේතු වීමෙන් ආයෝජන ගුණකය හරහා නිමැවුම් වැඩි වීමට හේතු වන බව පෙන්වා දෙයි.

කෙසේ නමුත් මෙ පැහැදිලි කිරීම් හරහා සම්භාව්‍යවාදීන්ට මෙන්ම කේන්සියානු මතවාදයට ද ආර්ථිකයක මූල්‍ය හා මූර්ථ විචල්‍යයන් අතර පැහැදිලි න්‍යායාත්මක සම්බන්ධයක් සැපයීමට නොහැකි විය. එම නිසා බොහෝ කලකට පසුව, උද්ධමනය (වැටුප් උද්ධමනය) සහ සේවා වියුක්තිය අතර ප්‍රතිලෝම සම්බන්ධයක් පවත්නා බව පැහැදිලි කරමින් මූල්‍ය හා මූර්ථ විචල්‍යයන් අතර ඍජු සම්බන්ධයක් දැක්වූ අතර එය **පිලිප්ස් වක්‍රය** (*Phillips Curve*) ලෙස හැඳින්වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**

Blanchard, O., and Fischer S. (1989). Lectures in Macroeconomics. Cambridge, Mass.: MIT Press.

Diamond, P. (1982), "Aggregate Demand Management in Search Equilibrium", Journal of Political Economy, vol. 90, pp. 881-894.

Dimand, R. (2008), "Macroeconomics, Origins and History of" in Durlauf, N. and L. Blume (eds.), The New Palgrave Dictionary of Economics, Second Edition.

Eichenbaum, M. (2010), "What Shortcomings in Macroeconomic Theory and Modelling have been Revealed by the Financial Crisis and how should they be Addressed in the Future?" Comments from an ECB panel, http://faculty.wcas.northwestern.edu/~yona/research.html

Frydman, R. (1983). "A Distinction between the Unconditional Expectational Equilibrium and the Rational Expectations Equilibrium." In Individual Forecasting and Aggregate Outcomes, edited by Roman Frydman and Edmund S. Phelps. Cambridge, Eng.: Cambridge University Press.

Moody, A., F. Ohnsorge, and D. Sandri. 2012. "Precautionary Savings in the Great Recession." *IMF Economic Review* 60 (1): 114–38. https://www.jstor.com/stable/41427964.

Phelps, E.S. 1968. "Phillips Curves, Expectations of Inflation and Optimal Monetary Policy over Time." *Economica* 34 (135): 254–81.